**(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)**

**අංක 3(10).]**

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2019 නොවැම්බර් 08 වැනි සිකුරාදා**

---

## 2019 දෙසැම්බර් 03 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

31/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1978 වර්ෂයෙන් ඇරඹි පළමුවන පාර්ලිමේන්තුවේ සිට අටවැනි පාර්ලිමේන්තුව දක්වා එක් එක් පාර්ලිමේන්තුවට අදාළව ඇති කරන ලද අමාත්‍ය මණ්ඩලවල සිටි කැබිනට්, රාජ්‍ය සහ නියෝජ්‍ය අමාත්‍යවරයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් අමාත්‍ය මණ්ඩලයේ සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් අමාත්‍ය මණ්ඩලයේ සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව අදාළ අමාත්‍ය මණ්ඩලයේ සිටි මුළු අමාත්‍යධූර සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) රටේ වර්තමාන කාන්තා ජනගහනයේ ප්‍රතිශතයට සරිලන සාධාරණ නියෝජනයක් අමාත්‍ය මණ්ඩල තුළ කාන්තාවන්ට ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

91/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙරටට ටින් මාළු ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(ii) එම ටින් මාළු ආනයනය කරනු ලබන මෙරට සමාගම් කවරේද;

(iii) 2018 වර්ෂය තුළ පරිභෝජනයට නුසුදුසු ටින් මාළු ආනයනය කළ අවස්ථා කවරේද;

(iv) එම ටින්මාළු ආනයනය කළ සමාගම් සහ ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) අදාළ ආනයන කටයුතු සඳහා පාරිභෝගික සේවා අධිකාරියේ අවසරය ලබා දී තිබේද;

(vi) ආනයනය කළ භාවිතයට නුසුදුසු ටින් මාළු සඳහා ගනු ලබන පියවර කවරේද;

(vii) ඊට පෙර අවස්ථාවලදීද පරිභෝජනයට නුසුදුසු ටින් මාළු ආනයනය කර තිබේ නම්, එම අවස්ථාවලදී ආනයනය කළ සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

147/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාත තුළ පිහිටි දේශීය කිරිපිටි කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්ත ශාලාවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් පසු මේ දක්වා එම කර්මාන්ත ශාලාවල නිෂ්පාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) වර්තමානයේදී ඌව පළාත් දේශීය කිරිපිටි කර්මාන්ත ශාලා මුහුණ දී ඇති ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

209/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2017 වර්ෂයේදී,

(i) දුම්රිය භාවිතා කළ මගීන් සංඛ්‍යාව;

(ii) මගී ප්‍රවාහනයෙන් ලැබුණු ආදායම;

(iii) මුද්‍රණය කරන ලද දුම්රිය ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව;

(iv) දුම්රිය ප්‍රවේශ පත්‍ර මුද්‍රණය සඳහා වැය කළ මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මගී ප්‍රවාහනය සඳහා දිනකට යෙදවිය යුතු දුම්රිය ගමන් වාර සංඛ්‍යාව;

(ii) සාමාන්‍යයෙන් දිනකට ක්‍රියාත්මක වන ගමන් වාර සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

269/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

343/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැකිරාව නගරයේ පිහිටි හින්දු කෝවිල ඉතාමත් පැරණි හා අබලන් තත්ත්වයේ පවතින බව දන්නේද;

(ii) දැනට මන්දගාමීව සිදුවන ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් සිදුකර මෙම කෝවිල ආගමික කටයුතු සඳහා හින්දු බැතිමතුන්ට පවරා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

433/'19

ගරු කනක හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සිවිල් ගුවන්සේවා අධිකාරියේ සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ස්ථිර සේවක සංඛ්‍යාව සහ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) සිවිල් ගුවන්සේවා අධිකාරියේ, අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ අංශ ප්‍රධාන අධ්‍යක්ෂවරුන්ගේ වයස් සීමාවන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම අධිකාරියේ සිටින උපදේශකවරුන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ වයස් සීමාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සිවිල් ගුවන්සේවා අධිකාරියේ නිලධාරින් විශ්‍රාම යනවිට පුරප්පාඩු වන එම තනතුරු සඳහා සුදුසුකම්ලත් දෙවන පෙළ නිලධාරින් කණ්ඩායමක් යෙදවීමට සැලසුම් කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

455/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මධ්‍යම අධිවේගී මාර්ගයේ, කුරුණෑගල සිට ගලගෙදර දක්වා ඉදිවෙන කොටසේ,

(i) සමස්ත දුර ප්‍රමාණය;

(ii) ඇස්තමේන්තුගත මුළු වියදම;

(iii) පිවිසුම් හා පිටවීමේ දොරටු ස්ථාපනය වන ස්ථාන;

(iv) ඉදිකිරීම් ආරම්භ කිරීමට හා අවසන් කිරීමට නියමිත දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අධිවේගී මාර්ගයේ ඉහත කොටස සඳහා මේ දක්වා,

(i) පවරා ගත් ඉඩම් ප්‍රමාණය;

(ii) ගෙවා ඇති මුළු වන්දි මුදල;

(iii) ගෙවීමට ඇති වන්දි මුදල් ප්‍රමාණය;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

467/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කය තුළ පිහිටි පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) මෙම එක් එක් පළාත් පාලන ආයතන මඟින් පාලනය වන ළමා උද්‍යාන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) 2010 වර්ෂයේ සිට මේ දක්වා මෙම එක් එක් ළමා උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ලබා දී ඇති වාර්ෂික ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) මෙම ළමා උද්‍යාන තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය දැනට ගෙන ඇති පියවර සහ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

504/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් මධ්‍යම නුවර ගම් පළාතේ ඉදිකළ නිවාස යෝජනා ක්‍රමයේ නිවාස බෙදා දෙනු ලැබූ පදනම කවරේද;

(ii) බෙදා දෙනු ලැබූ නිවාස ලබාගත් එක් එක් පුද්ගලයාගේ නම, නිවසේ අංකය, නිවාසලාභියා රජයේ සේවකයෙක්ද, රජයේ විශ්‍රාමිකයෙක්ද යන්න සඳහන් කරන්නේද;

(iii) නිවාස යෝජනා ක්‍රමය ප්‍රදේශයේ වන අලින් ගමන් ගන්නා අලිමංකඩක් අවහිර වන පරිදි ඉදිකර ඇති බව දන්නේද;

(iv) නිවාසලාභීන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා අලි වැටක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස යෝජනා ක්‍රමය විවෘත කිරීම සම්බන්ධයෙන් ප්‍රචාරක කටයුතු සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) නිවාස යෝජනා ක්‍රමය විවෘත කිරීම සඳහා ඉදි කරන ලද ඵලකය සඳහා ගෙවා ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ, නම් ඒ මන්ද?

518/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2014.01.01 දින සිට 2015.01.01 දින දක්වා ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් රාජ්‍ය බැංකුවලින් ලබාගෙන ඇති මුළු උකස් ණය ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් ස්වර්ණාභරණ උකස්කර ලබාගෙන ඇති ණය ප්‍රමාණය කොපමණද;

(iii) ස්වර්ණාභරණ උකස්කර රුපියල් ලක්ෂ දෙකට වඩා අඩුවෙන් ණය ලබාගෙන ඇති ස්ත්‍රීන් හා පුරුෂයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i) හි සඳහන් ණය ප්‍රමාණය එම කාලසීමාව තුළ නිකුත් කර ඇති සමස්ත ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

619/'18

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල - දොළොස්බාගේ මාර්ගය මංතීරු දෙකකට පුළුල් කිරීම සඳහා 2012 වර්ෂයේදී වැඩකටයුතු ආරම්භකර මේ වනවිට කුරුඳුවත්තේ සිට වැලිකන්ද දක්වා කිලෝමීටර් 7ක දුරක් කාපට් අතුරා වැඩ අවසන් කර ඇති බවත්;

(ii) 2015 ජනවාරි සිට පුරා වසර තුන හමාරක කාලය තුළ මෙම මාර්ගයේ කිසිදු වැඩ කටයුත්තක් සිදු නොවූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) විශාල වාහන ප්‍රමාණයක් හා විශාල ජනතාවක් භාවිතා කරන මෙම මාර්ගයේ ඉතිරි කිලෝමීටර් 4 සඳහා ප්‍රතිපාදන වෙන්කර වැඩ ආරම්භ කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

655/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ත්‍රිකුණාමලය – නුවර පාරේ, 6 කණුවේ සිට ත්‍රිකුණාමලය – අනුරාධපුර පාරේ, කින්නියා දක්වා දිවෙන ත්‍රිකුණාමලය පිටත වටරවුම් පාරේ වැඩ ආරම්භ කර වර්ෂ ගණනාවක් ගත වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2013.07.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මංතීරු 6ක් දක්වා වැඩි කළ හැකි වන පරිදි මං තීරු 4කින් යුක්තව මෙම මාර්ගය ඉදිකරන්නේද;

(ii) 2015 ජනවාරි වනවිටත් පාර කපා බොරළු දමා සකස් කර තිබුනද, අද වන තෙක්ම ගල් අතුරා කාපට් දැමීමට නොහැකි වීමට හේතුව කවරේද;

(iii) මේ වනවිට ඉදිකිරීම් භාර කොන්ත්‍රාත් සමාගම කවරේද;

(iv) මෙම මාර්ගයේ ඉදිකිරීම් අවසන් කර භාරදිය යුතු දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

676/'19

ගරු චන්දිම ගමගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපාදන යටතේ රුපියල් ලක්ෂ 368ක ඇස්තමේන්තුවකට NELSIP ව්‍යාපෘතිය මඟින් කැකිරාව ක්‍රීඩා පිටිය සංවර්ධනය කළ බවත්;

(ii) ව්‍යාපෘතියේදී සිදු වූ අක්‍රමිකතා හේතුවෙන් ව්‍යාපෘතිය අත්හැර දැමීමට සිදු වූ බවත්;

(iii) කැකිරාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් අනුරාධපුර පළාත් පාලන කොමසාරිස් මඟින් සහ NELSIP ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා මඟින් තත්ත්ව පාලනය, ප්‍රමිතිය හා වැය කරන ලද මුදල් සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියෝග කර ඇතත්, එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොමැති බවත්;

(iv) මෙම ව්‍යාපෘතියේ රුපියල් ලක්ෂ 35ක පමණ වංචා දූෂණ සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පළාත් පාලන කොමසාරිස්, ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති සහ ප්‍රාදේශීය සභා ලේකම්ගේ අවශ්‍යතාවය මත මෙම ක්‍රීඩා පිටිය මහජන අයිතියට පැවරීමට සහ පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට පෙර සංගීත සංදර්ශනයක් සඳහා පරිහරණය කරන ලද බවත්;

(ii) මෙම ක්‍රියාකලාපය මඟින් සිදු වූ වංචා දූෂණ වසන් කිරීමට උත්සාහ දරන බවත්;

තවදුරටත් එතුමා දන්නෙහිද?

(ඇ) පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීමට සහ ක්‍රීඩා පිටිය මහජන අයිතියට පවරන තෙක් පරිහරණය කිරීම ප්‍රමාද කරන ලෙස නියෝග කරන්නෙහිද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

688/'18

ගරු බිමල් රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2010 සිට 2017 දක්වා කොළඹ, ගාල්ල, මාතර, නුවර, කුරුණෑගල, යාපනය සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජාතික පාසල්වල,

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු කවරේද;

(ii) ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත 6 වැනි ශ්‍රේණියට ඇතුලත් වූ ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 5 ශ්‍රේණියේ සහ 6 ශ්‍රේණියේ සමාන්තර පන්ති සංඛ්‍යාව කොපමණද;

(iv) 6 වැනි ශ්‍රේණියට ශිෂ්‍යත්ව ප්‍රතිඵල පදනම් කර නොගෙන ප්‍රාථමික අංශයේ සිට පැමිණි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(v) 6 ශ්‍රේණියේ මුළු සිසුන් සංඛ්‍යාවෙන්, ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත ඇතුලත් වූ සිසුන්ගේ ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ඇ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් සකස් කරන ලදුව, 2019 ඔක්තෝබර් 12 දිනැති අංක 2144/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2019 අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජූලි 10 දිනැති අංක 2131/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 09 දිනැති අංක 2135/55 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 10 දිනැති අංක 2135/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 01 දිනැති අංක 2134/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 08 දිනැති අංක 2135/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 10 දිනැති අංක 2135/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 07 දිනැති අංක 2139/74 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 10 දිනැති අංක 2140/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 2143/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),—2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 02 දිනැති අංක 2143/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ බලයලත් වෙළඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 17 දිනැති අංක 2145/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 1),— (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව අනුමත කළ යුතු ය.

(2019 සැප්තැම්බර් 10 දිනැති අංක 2140/19 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 2),— (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව අනුමත කළ යුතු ය.

(2019 සැප්තැම්බර් 27 දිනැති අංක 2142/87 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 සහ 69 වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 117 වගන්තිය යටතේ සේවක පිරිස් සහ පුහුණු කිරීමේ ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 03 දිනැති අංක 2078/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 22 දිනැති අංක 2146/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මුද්‍රණ දෝෂ සංශෝධනය කරන ලද, 2019 ඔක්තෝබර් 03 දිනැති අංක 2143/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා,— ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ නියෝග (අංක 1),— 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8(2) වගන්තිය සමඟ කියවිය යුතු 24 වගන්තිය යටතේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ඉ - ජනගහන රෙජිස්ටර සම්බන්ධයෙන් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 මැයි 29 දිනැති අංක 1864/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා,— ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ නියෝග (අංක 2),— 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8(2) වගන්තිය සමඟ කියවිය යුතු 24 වගන්තිය යටතේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ඉ - ජනගහන රෙජිස්ටර සම්බන්ධයෙන් ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 14 දිනැති අංක 2114/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා,— ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ නියෝග (අංක 3),— 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8(2) වගන්තිය සමඟ කියවිය යුතු 24 වගන්තිය යටතේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ඊ - පුද්ගලයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 21 දිනැති අංක 2115/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.11.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

මරණ දණ්ඩනය අහෝසි කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2019 දෙසැම්බර් 04 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

22/'18

ගරු හේෂා විතානගේ මහතා,— බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ලියාපදිංචි කර ඇති දහම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) දහම් පාසල් ගුරුවරුන්ට රජය විසින් ලබාදෙන ප්‍රතිලාභ කවරේද;

(iii) දහම් අධ්‍යාපනය නංවාලීම සඳහා මෙම ස්වෙච්ඡා දහම් පාසල් ගුරුවරුන් වෙනුවෙන් ඉදිරියට සැලසුම් කර ඇති වැඩසටහන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

92/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා විනාශ කර ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් සඳහන් කරන්නේද;

(iii) එම පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට හේතු කවරේද;

(iv) අදාළ පුරාවිද්‍යා ස්ථාන විනාශ කළ පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(v) ඔවුන්ට ලබාදුන් දඬුවම් කවරේද;

(vi) හඳුනානොගත් පුද්ගලයන් විසින් විනාශ කර ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vii) රටක ඓතිහාසික අභිමානය සුරකින පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට එරෙහිව ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

346/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවැලි H කලාපයේ පිහිටි ගල්නෑව බස්නැවතුම්පොළ ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බව දන්නේද;

(ii) එය මගී ජනතාවට භාවිතයට ගත හැකි වන අයුරින් අලුත්වැඩියා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

434/'19

ගරු කනක හේරත් මහතා,— සංචාරක සංවර්ධන, වනජීවි සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා දෙස් විදෙස් සංචාරකයන් විශාල සංඛ්‍යාවක් පැමිණෙන බවත්, එම ආයතනය මඟින් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබාදෙන බවත් දන්නේද;

(ii) වර්ෂ 2015 සිට 2018 දක්වා පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා පැමිණි විදේශීය සංචාරකයන් සංඛ්‍යාව, එක් එක් කාර්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2015 සිට 2018 දක්වා එමඟින් ලැබුණු ආදායම එක් එක් වර්ෂය සහ කාර්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට අලි පැටවුන්ට කිරි පෙවීම සඳහා අවස්ථාවක් ලබා දීම මේ වනවිට නවතා තිබේ නම්, එයට හේතු කවරේද;

(ii) ඒ හේතුවෙන් ආයතනය වාර්ෂිකව ලබන අලාභය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට වටිනා සම්පතක් වන පින්නවල අලි අනාථාගාරය වැඩිදියුණු කිරීම සඳහා රජය මඟින් යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

608/’18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත්,

(i) කාර්මික ජනපද සංඛ්‍යාව;

(ii) බිම් ඒකක සංඛ්‍යාව;

(iii) කාර්මික ජනපදවල ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව;

(iv) කාර්මික ජනපදවල සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 වර්ෂයේදී කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මධ්‍යම පළාත වෙනුවෙන්,

(i) ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදුකළ වැඩසටහන්;

(ii) එම වැඩසටහන් පැවැත් වූ ස්ථාන;

(iii) ලබා දී ඇති උපකරණ;

(iv) ප්‍රතිලාභීන් තෝරාගත් පදනම;

(v) සිදුකරනු ලැබූ තාක්ෂණික පුහුණු වැඩසටහන්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ විද්‍යුත් ව්‍යාපාර සිදුකිරීමේ හැකියාව ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා ද විවෘතව පවතින නමුත්, ඒ සඳහා අවශ්‍ය දැනුම ප්‍රමාණවත් පරිදි ලබා දී නොමැති බව පිළිගන්නේද;

(ii) මෙම දැනුම විධිමත්ව ලබාදීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

620/’18

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නාවලපිටිය නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නාවලපිටිය නගරයේ වාහන තදබදය අවම කිරීමේ අරමුණින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රුපියල් ලක්ෂ 300ක වියදමින් නාවලපිටිය නගරය මැදින් ගුවන් පාලමක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) වත්මන් නාවලපිටිය නගර සභාව විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ අවසරයකින් තොරව මෙම රාජ්‍ය දේපළ කඩා ඉවත්කර විකිණීමට යන බව දන්නේද;

(iii) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිකළ මෙම පාලම ඔබ අමාත්‍යාංශයේ අවසරයකින් තොරව කඩා ඉවත් කිරීම නතර කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

651/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) චීන වරායේ පිහිටි තෙල් ටැංකි සංකීර්ණය බණ්ඩාරනායක පාලන කාලයේදී ස්ටලින් පවුම් 250,000ක් ගෙවා රජයට පවරා ගනු ලැබූ අතර ඉන්දියාවට බදු දී ඇති ටැංකි වලට අමතරව ඉතිරිවී ඇති තෙල් ටැංකිද ඉන්දියාවට බදු දෙනවා හැර ඵලදායී වෙනත් විකල්පයක් නොමැත්තේද;

(ii) නිදහසින් පසු අද දක්වාම පැවති විවිධ රජයන් සහ වර්තමාන රජය විසින් මෙම තෙල් ටැංකි සම්බන්ධයෙන් විවිධ අවස්ථාවල ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සහ ව්‍යාපෘති වාර්තා ඇත්නම්, ඒවායේ පිටපතක් බැගින් ලබා දෙන්නේද;

(iii) එම තෙල් ටැංකි ඉල්ලා ඇති රටවල් සහ ඉල්ලා ඇති පදනම කවරේද;

(iv) ඒවා ඉන්දියානු තෙල් සමාගම මඟින් ඉන්දියාවට ලබාදීමට එරෙහිව ජනමතයක් රට තුළ ගොඩ නැගී ඇති බැවින්, එම ජනමතයට කන්දීමක් ලෙස ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

773/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට 2016 වර්ෂයේ ජනවාරි සිට 2018 අගෝස්තු 31 දින දක්වා ලබා දී ඇති ණය මුදල් වටිනාකම කොපමණද;

(ii) මෙම ණය සඳහා අයකරනු ලබන පොලී අනුපාතිකය කොපමණද;

(iii) ඉහත ණය මුදල ගෙවා අවසන් කිරීම සඳහා ලබා දෙන උපරිම කාලසීමාව කොපමණද;

(iv) එම ණය මුදල් ලබාදීමේ දී අදාළ මූල්‍ය ආයතන තබා ගනු ලබන ඇපකර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) ට අනුව ලබා දී ඇති ණය මුදලින්, 2018 අගෝස්තු 31 දින වනවිට අය වී ඇති මුළු මුදල හා පොළිය කොපමණද;

(ii) මේ වනවිට අයවිය යුතු නමුත්, මෙතෙක් අය වී නොමැති ණය මුදල් අයකර ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සෑහීමට පත්වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 දෙසැම්බර් 05 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

28/'18

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ සෑම ග්‍රාම නිලධාරි වසමක් සඳහාම "සේවා පියස" කාර්යාලයක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) "සේවා පියස" එක් කාර්යාලයක් ඉදිකිරීමට ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මෙම වැඩසටහන අවසන් කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

151/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ හා සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට සහභාගී වූ, පළාත් පාලන නියෝජිතයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නියෝජිතයන්ගේ නම් හා අදාළ පළාත් පාලන ආයතන කවරේද;

(iii) එම වැඩමුළු පැවති රටවල්, නගර හා කාලසීමා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම එක් එක් වැඩමුළුවලට සහභාගී වීම සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම වැඩමුළුවලින් පසුව කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් දියත් කළ පළාත් පාලන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

422/'19

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා Hyrax oil Sdn Bhd යන සමාගම අතර ලිහිසි තෙල් කලවම් කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම ගිවිසුමට අනුව එකඟතාවයට පැමිණි මූලික කරුණු පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iv) ඉහත ගිවිසුමට අනුව අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් නිසි අවසරයක් ගෙන තිබේද;

(v) ඉහත ගිවිසුම අනුව අදාළ සමාගම දැනටමත් ශ්‍රී ලංකාව තුළ ලිහිසි තෙල් කලවම් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදි කර තිබේද;

(vi) යෝජිත ලිහිසි තෙල් කලවම් කිරීමේ මධ්‍යස්ථානයට අවශ්‍ය තෙල් වර්ග ආනයනය කිරීමට බලපත්‍ර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

557/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1940 දශකයේ සිට කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පැවති ප්‍රධාන ඉන්ධන ගබඩාව යුද්ධය හේතුවෙන් විනාශ වූ අතර එය එම ස්ථානයෙන් ඉවත් කළ බව දන්නේද;

(ii) එම ඉන්ධන ගබඩාව පිහිටා තිබූ ඉඩම මේ වනවිට භාරව ඇත්තේ කවරෙකුටද;

(iii) එය එම පාර්ශ්වයට දීර්ඝ කාලීනව බදු දී තිබේද;

(iv) ප්‍රධාන ඉන්ධන ගබඩාව නැවතත් එම ඉඩමේ පිහිටුවීමට කටයුතු කරන්නේද;

(v) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වෙනත් ඉඩම් තිබේද;

(vi) එසේ නම්, ඒවා පිහිටා ඇති ස්ථාන සහ විශාලත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(ii) හි සඳහන් ඉඩමෙහි මේ වනවිට පවත්වාගෙන යන ඉන්ධන පිරවුම්හල පුද්ගලික පාර්ශ්වයකට අයත් බව දන්නේද;

(ii) එසේ නම්, එහි අයිතිකරු කවුරුන්ද;

(iii) එම ඉඩම බදු දී ඇති කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පච්චිලෙප්පල්ලි විවිධ සේවා සමූපකාර සමිතිය විසින් පච්චිලෙප්පල්ලි ප්‍රදේශයේ ඉන්ධන පිරවුම්හලක් පිහිටුවීම සඳහා කරන ලද ඉල්ලීමට මෙතෙක් අනුමතිය ලබානොදීමට හේතු කවරේද;

(ii) මේ වනවිට එම ප්‍රදේශයේ පුද්ගලික ඉන්ධන පිරවුම්හල් දෙකක් පිහිටුවීමට අනුමතිය ලබාදීමට හේතු කවරේද;

(iii) එම පිරවුම්හල් පච්චිලෙප්පල්ලි ප්‍රදේශයේ පිහිටා ඇති ස්ථාන සහ හිමිකරුවන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

609/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුස්සැල්ලාව නගරයේ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආගමික ස්ථානවල නම් කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, මේ දක්වා එම ආගමික ස්ථාන සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

643/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියානු සාගරයේ සමුද්‍රීය කටයුතු පිළිබඳ කලාපීය සංවිධානය Indian Ocean Marine Affairs Cooperation (IOMC) නමැති ආයතනයක් ශ්‍රී ලංකාවෙහි තිබේද;

(ii) එසේ නම්, එහි අරමුණු හා කාර්යභාරය කවරේද;

(iii) එය කලාපීය සංවිධානයක් නම්, එහි සාමාජික රටවල් කවරේද;

(iv) එහි සම්මුතිය කවරේද;

(v) එම සම්මුතියේ පිටපතක් ලබා දෙන්නේද;

(vi) එම සම්මුතිය අපරානුමත කර ඇත්නම්, එම රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

686/'18

ගරු කනක හේරත් මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග වගා කර ඇති ඉඩම් ප්‍රමාණය සහ එම වගාවන්හි යෙදෙන ගොවීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2015 සිට 2018 දක්වා ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග එලදාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුළු අපනයන භෝග වගාකරුවන් සඳහා රජය මඟින් ලබාදෙන සහනාධාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග වගාව පහත වැටී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

779/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018.04.30 දින දක්වා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කළමණාකරු (මානව සම්පත්/පාලන) ලෙස කටයුතු කළ නිලධාරියාගේ නම, තනතුරට පත් කරනු ලැබූ දිනය, තනතුරට අදාළ මාසික වැටුප සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) ඔහු ඉහත තනතුරට පත් කිරීමට පෙර එම අධිකාරිය තුළ වෙනත් තනතුරු දරා තිබේද;

(iii) එසේ නම්, තනතුරු සංඛ්‍යාව, තනතුරු නාම සහ තනතුරුවලට අදාළව ලබාගත් මාසික වැටුප කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම නිලධාරියා අධිකාරියේ තනතුරට අමතරව වෙනත් රාජ්‍ය ආයතනයක, දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක කිසියම් තනතුරක් දරා තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ නම සහ ලැබූ මාසික දීමනාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

868/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී කුවේට් අරමුදල නමැති ප්‍රභවයකින් නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට අරමුදල් වෙන් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, 2015 වර්ෂයේදී එම මුදල වැය නොකිරීමට හේතු කවරේද;

(iii) මේ වනවිට එම මුදල එම කටයුත්ත සඳහා වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

884/'19

ගරු බිමල් රත්නායක මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 නියං සහනාධාර අදියර II යටතේ සහන ලබා දී ඇති දිස්ත්‍රික්ක කවරේද;

(ii) ඒ සඳහා තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ඒ සඳහා වැය කළ මුළු මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ සඳහා නිකුත් කළ චක්‍රලේඛ කවරේද;

(iv) ඒ අතරින් අවසන්වරට ක්‍රියාත්මක වූ වලංගු චක්‍රලේඛය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වලංගු චක්‍රලේඛයට අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ ඒ සඳහා වැය කළ මුළු මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කවරේද;

(ii) අවලංගු වන අවස්ථාව වනවිට අංක NDRC/2018/03 චක්‍රලේඛයට අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ හඳුනාගෙන තිබූ ප්‍රතිලාභීන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පීඩාවට පත් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) පොල්පිතිගම එයට ඇතුලත් නොවන්නේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

972/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොලිස්පතිවරයාගේ ප්‍රධානත්වයෙන් පසුගිය වර්ෂයේ ආරම්භ කළ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රණවිරු ගම්මානය තුළ ස්ථාපිත කර ඇති ඉපලෝගම පොලිස් ස්ථානය තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බව දන්නේද;

(ii) පොලිස් ස්ථානයකට සුදුසු ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර එහි පොලිස් ස්ථානය පවත්වාගෙන යැමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1025/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 281, 282, 283 සහ 284 හි සඳහන් කර ඇති කරුණු අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය වෙනුවෙන් අනුගමනය කළ ප්‍රධාන ක්‍රියාමාර්ග පැහැදිලි කරන්නේද;

(ii) යෝජනා අංක 284ට අනුව, ශ්‍රී ලංකාවේ සුරැකුම් හා විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) කොටස් වෙළෙඳපොළ වර්ධනය මැන බැලීම සඳහා යොදා ගන්නා සම්මත දර්ශකයන්ට අනුව, වර්ෂ 2000 සිට 2017 දක්වා, ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළෙහි ප්‍රගතිය පිළිබඳ උපනතීන් දැක්වෙන වගුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) වර්තමානයේදී අසාමාන්‍ය ලෙස පොළී අනුපාතිකය ඉහළ ගොස් පැවතීම, කොටස් වෙළෙඳපොළ සංවර්ධනයට බාධාවක් ලෙස සලකන්නේද;

(v) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් දරනු ලබන අදහස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1037/'19

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වී ඇති, නමුත්, මේ වනතෙක් තීන්දුවක් ලැබී නොමැති මානව හිමිකම් සම්බන්ධ නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එකී නඩු ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වූ දින කවරේද;

(iii) එකී සියලු නඩුවලට අදාළ පැමිණිලිකරුවන් සහ නඩු අංක කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1045/'19

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික සමඟිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පිහිට වූ දිනය කවරේද;

(ii) එම කාර්යාලය පිහිටුවන ලද පනත කවරේද;

(iii) එහි අරමුණ කවරේද;

(iv) එහි නිලධාරි මණ්ඩලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කාර්යාලයට අයත් විෂය පථය කවරේද;

(ii) මූලාශ්‍ර අරමුදල් දේශීය හා විදේශීය වශයෙන් කවරේද;

(iii) අරමුදල් ලබා දුන් පුද්ගලයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වියදම් සාරාංශය කවරේද;

(v) මේ වනතෙක් සිදු කළ වැඩසටහන් සහ ඒවා මෙහෙයවීම් සිදු කළ පුද්ගලයන් කවුරුන්ද;

(vi) මේ සඳහා අරමුදල් සැපයූ රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(vii) සංහිඳියාව වර්ධනයට සිදු කළ කාර්යභාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1047/'19

ගරු අනුරාධ ජයරත්න මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018.03.18 දින ගම්පොළ මූලික රෝහලෙහි නව හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය සඳහා මුල්ගල තැබූ බවත්;

(ii) රෝහල් පරිශ්‍රයේ ඉඩකඩ සීමිත බැවින්, රෝහල් පාලන අධිකාරියේ ඉල්ලීම පරිදි යෝජිත ගොඩනැගිල්ලෙහි පදනම මහල් පහකට යෝග්‍ය වන පරිදි සැකසීමට තීරණය වූ බවත්;

(iii) පාලන අධිකාරියේ ඉල්ලීම නොසලකා හරිමින් අමාත්‍යාංශය මඟින් ගොඩනැගිල්ලේ පදනම මහල් දෙකකට යෝග්‍ය පරිදි සැකසීමට තීරණය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අදාළ ඉදිකිරීම් කටයුතු නියමිත පරිදි කරගෙන යෑම සඳහා ගිවිසුම්ගතව තිබුණද, මෙකී කාර්යය මන්දගාමීව සිදුවීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 දෙසැම්බර් 06 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

33/'18

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිරිවෙන් අධ්‍යාපන ආයතන සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේදී සලකා බලනු ලබන මූලික අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) දැනට පිරිවෙන් අධ්‍යාපන ආයතනවල ගුරු හිඟයක් පවතින්නේද;

(iii) එසේ නම්, ගුරුවරුන්ගේ හිඟය කොපමණද;

(iv) අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකය මඟින් පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

153/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැළිකසළ සම්බන්ධව තීරණ ගන්නා, ඒ සම්බන්ධව කටයුතු කරන පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන කවරේද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනවල නිලධාරීන් කැළිකසළ කළමනාකරණය සම්බන්ධව විදේශ අධ්‍යයන චාරිකාවල නිරත වී තිබේද;

(iii) එසේ නම්, එම නිලධාරීන්ගේ නම්, තනතුරු හා විදේශ අධ්‍යයනවල විස්තර කවරේද;

(iv) එම එක් එක් අධ්‍යයන කටයුතු සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එකී අධ්‍යයන චාරිකාවලට සහභාගි වූ නිලධාරීන්ගේ දැනුම අමාත්‍යාංශයේ කටයුතුවලට යොදාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

366/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ග්රෙඩ්වැලි වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

558/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි නගර මධ්‍යයේ පිහිටා ඇති සතොස වෙළඳ මධ්‍යස්ථානය ප්‍රාදේශීය සභාවේ අනුමතියකින් තොරව ඉදිකර ඇති බව දන්නේද;

(ii) සතොස ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම අයිති ආයතනය කවරේද;

(iii) මෙම ඉඩම කිසියම් පුද්ගලයෙකුට දිගුකාලීනව බදු දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සතොස වෙළඳ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන මෙම ගොඩනැගිල්ල,

(i) ඉදිකිරීම සඳහා කරෙච්චි ප්‍රාදේශීය සභාවේ අනුමතිය ලබාගෙන තිබේද;

(ii) එම ගොඩනැගිල්ලේ වර්තමාන අයිතිකරුගේ නම කවරේද;

(iii) රජයේ වියදමින් ඉදිකර තිබේ නම්, මිල ගණන් කැඳවීම පිළිබඳ තොරතුරු කවරේද;

(iv) ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දරන ලද පිරිවැය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

610/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ දෙක තුළ මහනුවර දිස්ත්‍රික්කයේ,

(i) සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව;

(ii) මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූ පුද්ගලයන් සංඛ්‍යාව;

(iii) අත්අඩංගුවට පත් වූ මත්ද්‍රව්‍යවල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දැනට හඳුනාගෙන ඇති තහනම් මත්ද්‍රව්‍ය ගණයට අයත් මත්ද්‍රව්‍ය වර්ග හා ඒවා මෙරටට පැමිණෙන රටවල් ඇතුළත් නාමලේඛනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොළ හා අවට ප්‍රදේශ කලක සිට මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ මධ්‍යස්ථානයක්ව පවතින බවත්, පාසල් ශිෂ්‍යයන් හා තරුණ පිරිස් ඉලක්ක කරගනිමින් සිදුකරන මෙම බෙදාහැරීමේ ජාලය තවමත් ශක්තිමත්ව ක්‍රියාත්මක වන බවත් දන්නේද;

(ii) මෙම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් කඩිනමින් නීතියේ රැහැනට හසුකර, මත් උවදුර ප්‍රදේශයෙන් තුරන් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

666/'18

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැතිවීම හේතුවෙන් ජනතාව බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

(ii) විශේෂයෙන්, මුලතිව් දිස්ත්‍රික්කයේ ඉතාමත් දුෂ්කර ප්‍රදේශ වන කෝට්ටෙකට්ටියකුලම්, තෙන්නියන්කුලම්, නාට්ටාංකණ්ඩල්, මුත්තුඅය්යන්කට්ටු යන ප්‍රදේශවල නිසි ප්‍රවාහන පහසුකම් නොමැතිවීම හේතුවෙන් පාසල් සිසුන් ඇතුළු පොදු ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

(iii) ධාවන කටයුතු සඳහා මුලතිව් ලංගම ඩිපෝවට බස්රථ 32 අවශ්‍යතාවයක් ඇතත්, දැනට තිබෙන බස්රථ 24 ක සංඛ්‍යාවෙන් ධාවනය සඳහා යොදවා ඇත්තේ බස්රථ 20 පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මුලතිව් ලංගම ඩිපෝවට තවත් නව බස්රථ ලබාදී, පොදු ජනතාවගේ පහසුව උදෙසා මගී බස් රථ සේවය ක්‍රමවත්ව ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

806/’19

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.02.01 දින සිට මේ දක්වා අත්අඩංගුවට ගනු ලැබූ නීති විරෝධී මත්ද්‍රව්‍ය අලෙවිය හා භාවිතය සම්බන්ධ පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) නීති විරෝධී මත්ද්‍රව්‍ය මර්දනය කිරීම සඳහා ක්‍රියා කරනු ලබන රාජ්‍ය හෝ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය මඟින් අත්අඩංගුවට ගනු ලැබූ නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

815/’19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකු ආධාර මත ක්‍රියාත්මක i - ROAD ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබූ ව්‍යාපෘති කවරේද;

(ii) ඒවා අතරින් ක්‍රියාත්මක කිරීමට අනුමත වී ඇති යෝජනා කවරේද;

(iii) එකී අනුමතිය පාදක කරගනු ලබන ආර්ථික විශ්ලේෂණය පිළිබඳ සමීක්ෂණය, (Economic Analysis) රථවාහන ගමනාගමනය පිළිබඳ සමීක්ෂණය (Traffic Survey) හා GPS සමීක්ෂණයේ කොන්දේසි හෝ නිර්ණායක වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ශ්‍රීපුර නගරයට ප්‍රවේශ වීමට ඇති ප්‍රධානම ගම්මැද මාර්ගය වන කිලෝ මීටර් 8ක පමණ දුරකින් යුත් සිංහපුර මාර්ගය මේ යටතේ කාපට් අතුරා සංවර්ධනය කරන්නේද;

(v) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පළාත් සහ රේඛීය අමාත්‍යාංශවලට අයත් මඟී ප්‍රවාහන සේවා ක්‍රියාත්මකවන මාර්ගවල අවම වශයෙන් කොන්ක්‍රීට් හෝ අතුරා නොමැති මාර්ග ගණනාවක් ඇති බැවින්, එම මාර්ග සංවර්ධනය කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

857/'19

ගරු කනක හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු, කොන්දොස්තර හා කාර්මික මට්ටමේ (PL කාණ්ඩයේ) නිලධාරින් සංඛ්‍යාව සහ විධායක මට්ටමේ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) PL කාණ්ඩයේ නිලධාරින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව වැටුප් ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) PL කාණ්ඩයේ නිලධාරින්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් පවතින බව දන්නේද;

(ii) ශ්‍රී ලංගම නිලධාරින්ට මේ වනවිට උසස්වීම් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම උසස්වීම ලබා දෙන ශ්‍රේණි කවරේද;

(iv) උසස්වීම් ලබා දෙනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016ට අනුවද;

(v) නොඑසේ නම්, කවර ක්‍රමවේදයකට අනුවද;

(vi) මෙම උසස්වීම් ලබාදීම මඟින් එක් ඩිපෝවකට අමතරව පත්වන විධායක නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

869/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේ උසස් අධ්‍යාපනය සඳහා ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව 30,000 ක් වන අතර එම සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) 2017 වර්ෂයේදී දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ පවත්වනු ලබන (HND) ගණකාධිකාරි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් 180 දෙනෙකු බඳවා ගත් නමුත්, 2018 වර්ෂයේ සිට එම සංඛ්‍යාව 114 දක්වා අඩු කර ඇත්තේ මන්ද;

(iii) මෙලෙස සෑම HND පාඨමාලාවකටම ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව අඩුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශිෂ්‍ය සංගම් පිහිටුවීම සඳහා පෙර පැවති අයිතිය අද වනවිට අහෝසි කර තිබීමට හේතුව කවරේද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි (SLIATE) ශිෂ්‍ය සංගම් අයිතිය අහෝසි කර තිබේද;

(iii) ශිෂ්‍ය සංගම් අහෝසි කිරීම නිසා දුක්ගැනවිලි සම්බන්ධයෙන් කවර කටයුත්තක් කළද එය විනය විරෝධී ලෙස සළකා දඬුවම් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

901/'19

ගරු බිමල් රත්නායක මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 නියං සහනාධාර අදියර I යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iii) මෙහි II අදියර සඳහා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් එකම ප්‍රතිලාභියෙක් හෝ තෝරා නොගත් බව දන්නේද;

(iv) එසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රාදේශීය ලේකම්වරයා ක්‍රියාත්මක කර ඇත්තේ අංක NDRSC/2018/03 දරන අවලංගු කරන ලද චක්‍රලේඛය බව පිළිගන්නේද;

(ii) වලංගු චක්‍රලේඛය වන අංක NDRSC/2018/03 ii ක්‍රියාත්මක නොකළේ මන්ද;

(iii) 2018.10.22 දින ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රතිලාභීන් නොමැති බව අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාට ලිඛිතව දැනුම් දී ඇත්තේ අවලංගු කරන ලද චක්‍රලේඛයේ 4 වගන්තියේ උපදෙස්වලට අනුකූලවද;

(iv) අවලංගු කරන ලද චක්‍රලේඛයේ 4 වගන්තිය උල්ලංඝනය කර ඇති බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1036/'19

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දිසා අධිකරණ වෙත යොමු වී ඇති පැමිණිලි අතරින් මෙතෙක් විභාග නොවූ සහ විභාග වෙමින් පවතින නඩු තිබෙන්නේ නම්, අදාළ නඩු අංක සහ ඒවා අධිකරණගත වූ දින සමඟ වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(ii) විසඳුමක් නොලැබුණු එකී නඩු අතර වසර 25කට වඩා වැඩි; වසර 20 - 25 අතර; වසර 15 - 20 අතර; වසර 10 - 15 අතර; වසර 05 - 10 අතර සහ වසර 01 - 05 අතර කාලයක් පැරණි නඩු කවරේදැයි අදාළ නඩු අංක හා මුලින්ම ලේඛනගත වූ දින සමඟ වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1039/'19

ගරු විදුර වික්‍රමනායක මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෛනිකව පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ මහජනතාව විශාල වශයෙන් ගැවසෙන හොරණ නගරය සාමාන්‍ය වර්ෂා දිනවලදී පවා ජලයෙන් යට වන බවත්;

(ii) එමෙන්ම, හොරණ නගරයේ, ශ්‍රී ධම්මරතන මාවත ප්‍රදේශය ඇතුළු තවත් ප්‍රදේශ කිහිපයක් සාමාන්‍ය වර්ෂා දිනවලදී පවා වර්ෂා ජලයෙන් යටවීම හේතුවෙන් එම ප්‍රදේශවල නිවැසියන්ගේ නිවාස, දේපළ සහ ගෘහභාණ්ඩ අවස්ථා කිහිපයකදීම හානියට පත් වූ බවත්;

(iii) හොරණ මූලික රෝහල ආසන්න ප්‍රදේශයද සාමාන්‍ය වර්ෂා අවස්ථාවලදී පවා ජලයෙන් යටවීමෙන් රෝහලට පැමිණෙන රෝගීන්ද මහත් අපහසුතාවයන්ට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත තත්ත්වය පාලනය කිරීම සඳහා හොරණ නගරයේ කාණු පද්ධතිය ක්‍රමවත්ව සකස් කිරීමට ඉක්මනින් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1048/’19

ගරු අනුරාධ ජයරත්න මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පොළ, උඩපළාත ප්‍රාදේශීය සභාවට අයත් ගලත, මාවතුර, කැකුලන්ද, වැලිගම හා කලුගල්හින්න යන ප්‍රදේශවල ජනතාව දීර්ඝ කාලයක සිට උග්‍ර පානීය ජල ගැටලුවකින් පීඩා විඳින බවත්;

(ii) මෙම ප්‍රදේශවලට අදාළ ජල ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කර මූල්‍යය පහසුකම් ලබා ගැනීමට ක්‍රියා කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජලය නොමැතිකමින් පීඩා විඳින ඉහත ප්‍රදේශයන්හි ජනතාවට පානීය ජල පහසුකම් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1053/’19

ගරු විමලවීර දිසානායක මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018/2019 මහ කන්නයේදී අම්පාර දිස්ත්‍රික්කයේ, බඩ ඉරිඟු වගාකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ප්‍රමාණයෙන් සේනා දළඹු හානියෙන් විනාශ වූ වගාබිම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සේනා දළඹු හානිය නිසා විනාශ වූ බඩ ඉරිඟු වගාවන් සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන්ට ගෙවූ මුළු වන්දි ප්‍රමාණය කොපමණද;

(iv) එම වන්දි මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සේනා දළඹු හානියෙන් විනාශ වූ බඩ ඉරිඟු වගාවන් සඳහා වන්දි නොලැබූ ගොවීන් විශාල සංඛ්‍යාවක් අම්පාර ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක සිටින බව දන්නේද;

(vi) අසාධාරණයට ලක් වූ එම ගොවීන් සඳහා වන්දි ගෙවීමක් සිදු කරන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 දෙසැම්බර් 17 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

43/'18

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලේබොඩ, උඩකන්ද නමින් කුඹුරු යායක් තිබෙන බව දන්නේද;

(ii) මෙම කුඹුරු යායේ ඇති කුඹුරු ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) දැනට වසර දහයක පමණ කාලයක සිට මෙම කුඹුරු යායට ජලය නොමැති වීම හේතුවෙන් පුරන් වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, කුඹුරු යාය අස්වැද්දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

94/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂය වනවිට ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ඉන්ටර්පෝල් ලැයිස්තුවට ඇතුළත් කරන ලද LTTE හිතවාදී සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම අවස්ථාව වනවිට අදාළ ලැයිස්තුවට ඇතුළත්ව සිටි කොටි ත්‍රස්තවාදීන් සංඛ්‍යාව සහ පාතාල සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයෙන් පසුව මේ වනවිට ඉන්ටර්පෝල් ලැයිස්තුවෙන් ඉවත් කර ඇති LTTE හිතවාදී සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 න් පසුව මේ වනවිට ඉන්ටර්පෝල් ලැයිස්තුවෙන් ඉවත් කර ඇති කොටි ත්‍රස්තවාදීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංවිධාන සහ ත්‍රස්තවාදීන් ඉන්ටර්පෝල් ලැයිස්තුවෙන් ඉවත් කිරීමට හේතු කවරේද;

(iv) අදාළ ඉවත් කිරීම් සඳහා ශ්‍රී ලංකා රජයේ අනුමතිය ලබා දී තිබේද;

(v) ජාත්‍යන්තර වශයෙන් LTTE හිතවාදීන් ශ්‍රී ලංකා රජයට එරෙහිව ගෙන යන වැඩපිළිවෙළට එම ඉවත් කිරීම්වලින් උත්තේජනයක් ලැබෙන බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

154/'18

ගරු වමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල - බණ්ඩාරවෙල මාර්ගයේ, 2 වැනි සැතපුම් කණුව අසළ පාලම දැඩි ලෙස අබලන් වී ඇති බව දන්නේද;

(ii) මෙම පාලම හරහා ප්‍රවේශ විය යුතු ගම්මානවල නම් කවරේද;

(iii) මෙම පාලමේ ඇති පෞරාණික බව ආරක්ෂා වන පරිදි නවීකරණය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

473/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනාධිපතිවරයා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම්, ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහි කුමන්ත්‍රණ චෝදනාවකට ලක්ව සිටින නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතාගේ සේවා කාලය තුළ විෂමාචාර හෝ වෙනයම් චෝදනා එල්ල වී තිබුනේ නම්, එකී සිද්ධිය, දිනය, ගෙන ඇති විනය හා වෙනත් නෛතික ක්‍රියාමාර්ගවල තීන්දු හා ඒවායේ පිටපත් ලබා දෙන්නේද;

(ii) ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ, නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස ඔහු කරන ලද සේවාවල නිරවද්‍ය හා නිර්පාක්ෂිකභාවය පිළිබඳව සෑහීමකට පත්වන්නේද;

(iii) චෝදනා එල්ල වී ඇත්තේ රටේ නායකයාට හා ත්‍රස්තවාදය විනාශ කළ ආරක්ෂක අමාත්‍යාංශයේ, හිටපු ලේකම්වරයාට එරෙහි කුමන්ත්‍රණයකට බැවින්, එම නිලධාරියා අනිවාර්ය නිවාඩු යැවීමෙන් පමණක් සාධාරණ පරීක්ෂණයක් සිදු කෙරෙනු ඇතැයි සෑහීමකට පත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

503/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 සිට 2017 දක්වා එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා මෙහෙයුම් සඳහා සහභාගි කළ ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) සාමසාධක රාජකාරි සඳහා තෝරා ගන්නා නිලධාරීන් සඳහා වර්තමානයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ නිර්දේශයක් අවශ්‍යයැයි ආරක්ෂක අමාත්‍යාංශය නියෝග කර තිබේද;

(iii) උක්ත නිලධාරීන් පිළිබඳව සොයා බලා එක්සත් ජාතීන්ගේ සංවිධානයට නිර්දේශ කිරීමට වඩාත් සුදුසු රාජ්‍ය ආයතන තිබියදී, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට එය පැවරූ පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 සිට මේ දක්වා ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන්ගේ නිශ්කාෂණ වාර්තා ලබාදීම සඳහා කොමිසමට යැවූ ලිපිගොනු සංඛ්‍යාව සහ නිශ්කාෂණ ලබා දුන් ලිපිගොනු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට සාමසාධක රාජකාරි සඳහා සහභාගි වන සංඛ්‍යාව සීඝ්‍රයෙන් අඩුවී ඇති බව දන්නේද;

(iii) එයට හේතු කවරේද;

(iv) 2018 මාර්තු මාසයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත ලබා දුන් ලිපිගොනු 400න් මේ දක්වා නිශ්කාෂණ වාර්තා ලබා දී ඇත්තේ ලිපිගොනු 07කට පමණක් බව දන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

544/'19

ගරු බිමල් රත්නායක මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා පේෂකර්ම සංස්ථාවට අයත්ව පැවති තුල්හිරිය පෙහෙකම්හල මුලින්ම බොම්බෙ ටෙක්ස් ආයතනයට විකුණූ බවත්;

(ii) පසුව එම සමාගම විසින් එය කොරියන් සමාගමක් වූ කාබුල් ලංකා ආයතනයට විකුණූ බවත්;

(iii) කාබුල් ලංකා සමාගම විසින් එය වාස් ගෝල්ඩන් ආයතනයට පවරන විට සේවකයන්ට පාරිතෝෂික දීමනා හා වන්දි ගෙවූ බවත්;

(iv) මේ සෑම අවස්ථාවකම ආයතනය විකුණා ඇත්තේ සේවකයන් සහ ඔවුන්ගේ අයිතීන්ද ඇතුළත්ව බවත්;

(v) ඒ වනවිට නිල නිවාසවල පදිංචිව සිටි සේවකයන්ට, කිසිදු මුදලක් නොගෙවූ බවත්;

(vi) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මේ වනවිට මෙම නිවාසවල පදිංචි පුද්ගලයන් ඉවත් කිරීමට උත්සාහ කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සේවයෙන් විශ්‍රාම යනවිට හෝ සේවයෙන් ඉවත් කරන විට මෙම සේවකයන්ට ගෙවා නොමැති පාරිතෝෂික මුදල හා වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) නිල නිවාසවල වසර 40ක පමණ කාලයක් පදිංචිව සිටින පුද්ගලයන් එම නිවාසවලින් ඉවත් කිරීමේ උත්සාහය වළක්වා නිවාසවල හිමිකම ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

604/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහජන ආධාර ලබා දෙනු ලබන්නේ කිසිදු ආදායමක් නොමැති රෝගී හෝ ආබාධිත තත්ත්වයේ පසුවන පුද්ගලයන්ට හෝ පවුල්වලටද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 143 බී, නුගදණ්ඩ ග්‍රාම නිලධාරි වසමේ, පුද්ගලයන් 23 දෙනෙකුට මහජන ආධාර ලබා දෙන බවත්, ඔවුන් අතරින් 05 දෙනෙකුට මාසිකව රු. 300/- බැගින්ද, අනෙක් අයට රු. 250/- බැගින්ද ලබා දෙන බව පිළිගන්නේද;

(ii) මෙම මුදල එම පවුල් සඳහා එක දිනයක වියදමටවත් නොසෑහෙන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, මෙම අසරණ පවුල් සඳහා ලබා දෙන නාමික දීමනාව වෙනුවට රු. 1000/- හෝ දීමනාවක් ලබාදීමට එකඟවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

831/'19

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය ශික්ෂණ රෝහලේ වසර 8ක කාලයක් භාවිතා කළ සී.ටී. ස්කෑනර් යන්ත්‍රය අක්‍රිය වී ඇති බවත්;

(ii) මේ හේතුවෙන් රෝගීන් නොයෙකුත් දුෂ්කරතා මැද වවුනියාව හා අනෙකුත් රෝහල් කරා ගෙන යා යුතුව ඇති බවත්;

(iii) නව සී.ටී. ස්කෑනර් යන්ත්‍රයක් ලබාදෙන බවට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය පොරොන්දු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නව සී.ටී. ස්කෑනර් යන්ත්‍රයක් යාපනය ශික්ෂණ රෝහල වෙතට ඉක්මනින් ලබා දීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එය ලබා දෙනු ලබන දිනය කවරේද;

(iii) දැනට අක්‍රියවී තිබෙන සී.ටී. ස්කෑනර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා කිසියම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

858/'19

ගරු කනක හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා නව බස් රථ 2200ක් ගෙන්වා ඇති බවත්;

(ii) මෙම බස් රථ ලබා දී ඇත්තේ කල්බදු ක්‍රමය යටතේ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ සිට එම කල්බදු ගෙවීම් නතර කර තිබේද;

(ii) එසේ නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

918/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා වැය කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම මුදල් සපයා ගත් මූලාශ්‍ර කවරේද;

(iii) වරාය විවෘත කළ දිනයේ සිට මේ දක්වා එම වරායට පැමිණි නැව් සංඛ්‍යාව, එම නැව්වල නම් සහ ගොඩබාන ලද බහාලුම් සංඛ්‍යාව, මාසිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම කාලසීමාව තුළ වරායේ ආදායම සහ නඩත්තු වියදම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) හම්බන්තොට වරාය, කලාපයේ දියුණු වරායක් බවට පත් කිරීම සම්බන්ධයෙන් යහපාලන රජයේ දැක්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1009/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 අප්‍රේල් මාසයේදී, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් රේඩාර් රිසීවරයක් හා ඇන්ටනා ස්කැනරයක් අලුත්වැඩියාව සඳහා චීනයට යවා තිබූ නමුත් එම භාණ්ඩ අස්ථානගත වී ඇති බව පිළිගන්නේද;

(ii) එම භාණ්ඩ ප්‍රවාහනය කිරීමට භාරගත් සමාගම කවරේද;

(iii) එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කවුරුන්ද;

(iv) එම සමාගම තවමත් ශ්‍රී ලංකාවේ කවර හෝ රාජ්‍ය ආයතනයකට සේවා සපයන්නේද;

(v) එම භාණ්ඩ අස්ථානගත වීමෙන් සිදුවූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1027/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුදල් අමාත්‍යවරයා විසින්, 'දින 100 විප්ලවය' පිළිබඳ ප්‍රකාශනයෙන් ප්‍රකාශ කළ පරිදි, ගොවි ජනතාව විසින් වාණිජ බැංකුවලට ගෙවීමට ඇති රුපියල් 100,000/- දක්වා වූ ණය ප්‍රාග්ධනයෙන් 50%ක් කපා හරිනු ලැබුවේද;

(ii) ගොවි ණය කපා හැරීම හේතුවෙන් රජයට ඇති වූ වැය බර ප්‍රමාණය කොපමණද;

(iii) ණය කපා හරින ලද ගොවීන්ගේ නාමලේඛනයක් සහ එම එක් එක් ගොවියාගේ නමට ඉදිරියෙන් කපා හරින ලද ණය ප්‍රමාණය දැක්වෙන ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) ගොවීන්ගේ කපා හරින ලද ණය වෙනුවෙන් වාණිජ බැංකුවලට රජය විසින් මේ දක්වා ගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1049/'19

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරීන් මධ්‍යම මට්ටමේ කාර්මික සේවාවට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධව නිකුත් කරන ලද අංක 22/2002 චක්‍රලේඛයට අනුව සබරගමු පළාත් සෞඛ්‍ය නිලධාරින් හෝ රාජ්‍ය සේවා කොමිසමේ නිලධාරින් කටයුතු නොකරන්නේ මන්ද;

(ii) සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ නියෝගය පරිදි පළාත් රාජ්‍ය සේවා කොමිසම ක්‍රියා නොකිරීමට හේතු කවරේද;

(iii) පළාත් රාජ්‍ය සේවා කොමිසමේ ලේකම්වරයා ආණ්ඩුකාරවරයාගේ නියෝගය අවස්ථා තුනකදීම නොසලකා හැරීමට හේතු කවරේද;

(iv) එම මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරින්ට ගෙවිය යුතු මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(v) ඉදිරියේදී එම මුදල් ගෙවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1071/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2019.03.27 හෝ ආසන්න දිනයකදී ඩේලි නිවුස් පුවත්පතේ පළවූ දැන්වීමක,

(i) 2018.12.31 දින සිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අත්පත් කර ගත් බවත්;

(ii) 2019.04.01 දින සිට එම බැංකුවේ සියලු බැංකු කටයුතු ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හරහා සිදුකරනු ලබන බවත්;

(iii) අත්පත් කර ගැනීම සඳහා 1988 අංක 30 දරන බැංකු පනතේ 76(J)(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමතිය ලබා දී ඇති බවත්;

සඳහන් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම දැන්වීම පළකිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතිය ලබා දී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මෙම අත්පත් කර ගැනීම සඳහා,

(i) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ;

(ii) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ වාර්ෂික මහා සභා රැස්වීමේ;

(iii) සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ;

(iv) මුදල් අමාත්‍යවරයාගේ;

(v) පාර්ලිමේන්තුවේ;

අනුමතිය ලැබී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කොටස් හිමියන් සහ ඔවුන් සතු කොටස් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1134/'19

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් සිදුකරන නිවාස ඉදිකිරීම්වලදී දේශීය මැටි සෙවිලි උළු නිෂ්පාදකයන්ට සෙවිලි උළු සැපයීමේ අවස්ථාව අහිමි වී ඇති බවත්;

(ii) එමඟින් 100% සෞඛ්‍යයට හිතකර දේශීය සෙවිලි උළු නිෂ්පාදනය කඩාවැටී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉදිරියේදී රජය විසින් සිදු කරන නිවාස ව්‍යාපෘති සඳහා දේශීය මැටි සෙවිලි උළු භාවිතා කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 දෙසැම්බර් 18 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

52/'18

ගරු හේෂා විතානගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පුරනැගුම ව්‍යාපෘතිය මඟින් බදුල්ල දිස්ත්‍රික්කය තුළ ඉදිකරනු ලැබූ දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කරනු ලැබූ මුදල කොපමණද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ප්‍රමිතිය උසස් කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

99/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රටේ පවත්නා අපරාධ මැඩලීමේ කටයුතුවල යෙදී සිටියදී, 2015 වර්ෂයේ සිට ඝාතනය වූ පොලිස් නිලධාරීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) එම පොලිස් නිලධාරීන් ඝාතනය වීමට හේතු සඳහන් කරන්නේද;

(iii) ඔවුන්ගේ අඹුදරුවන් වෙනුවෙන් ගෙවන ලද දීමනාවල වටිනාකම සඳහන් කරන්නේද;

(iv) එම නිලධාරීන්ගේ අඹුදරුවන් ආරක්ෂා කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව ගෙන ඇති පියවර කවරේද;

(v) ඔවුන්ගේ වැන්දඹු අනත්දරු දීමනා නිසි පරිදි ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඝාතනය වූ පසු උසස්වීම් ලබා දී ඇති පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඝාතනය වූ පසු උසස් වීම් ලබා දී නොමැති පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඝාතනය වූ පසු උසස්වීම් ලබා දී නොමැති නිලධාරීන් සඳහා උසස්වීම් ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අපරාධ මැඩලීමේ ක්‍රියාවලියේ යෙදී සිටින පොලිස් නිලධාරීන්ගේ ජීවිතාරක්ෂාව සහ ඔවුන්ගේ අඹුදරු රැකවරණය සම්බන්ධයෙන් මේ වනවිට පවතින ක්‍රමවේදය වර්ධනය කිරීමට ඉදිරියේදී කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එය සිදු කරනු ලබන කාලසීමාව සහ අපේක්ෂිත ක්‍රමවේදය සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

165/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් පාසල්වල සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරුවරු අතරින් බොහෝ පිරිසකට හිඟ වැටුප් ගෙවීමට ඇතිබව දන්නේද;

(iii) එම ගුරුවරුන්ට හිමි හිඟ වැටුප් ගෙවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

368/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු කොළපතන වතුයායේ සේවය 2002 වර්ෂයේදී කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිට සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, ලියාපදිංචි සාමාජික අංකය, සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

497/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2017.12.31 දිනට ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ නියමිත මිනිස් බල ඇස්තමේන්තුව හා බඳවා ගැනීමේ පටිපාටියට අනුව සේවය කළ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) 2015 ජනවාරි සිට මේ දක්වා ආයතනයට බඳවා ගෙන ඇති ස්ථිර, අනියම් හා තාවකාලික සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බඳවා ගැනීමේ පටිපාටියෙන් බැහැරව බඳවා ගත් පුද්ගලයන්ද ඒ අතර සිටින බව පිළිගන්නේද;

(v) මෙම බඳවා ගැනීම් හා ඔවුන්ට වැටුප් ගෙවීම් පිළිබඳව ජනතා වතු සංවර්ධන මණ්ඩලය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ, නම් ඒ මන්ද?

559/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ ක්‍රියාත්මක රාජ්‍ය බැංකු, පෞද්ගලික බැංකු, රක්ෂණ ආයතන, මූල්‍ය සමාගම් සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) සාමාන්‍ය ජනතාවට ණය ලබාදීමේදී රාජ්‍ය බැංකු, පෞද්ගලික බැංකු හා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් අයකරනු ලබන පොලී අනුපාත වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ආයතනයන්හි අසාධාරණ ක්‍රියාකාරකම් හේතුවෙන් විශාල වශයෙන් ජීවිත අහිමිවීම් සිදුවන බව දන්නේද;

(ii) ඉදිරියේදී ක්ෂුද්‍ර මූල්‍ය ණය ආයතන හේතුවෙන් සිදුවන මෙවන් ජීවිත අහිමිවීම් වැළැක්වීම සඳහා එම ආයතනවල කටයුතු අධීක්ෂණය කිරීමට රජය මැදිහත් වන්නේද;

(iii) යුද්ධයෙන් විපතට පත්ව තම ආර්ථික හැකියාවන් අහිමි වී සිටින උතුරු හා නැගෙනහිර පළාත්වල ජනතාව ඉලක්ක කර ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය ණය ආයතන ඔවුන්ගේ ක්‍රියාකාරකම් කඩිනමින් සිදු කිරීමේ අරමුණ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

670/'18

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම, මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලෛයන්කට්ටු ගම්මානයේ නැවත පදිංචිකර ඇති ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීමේ අරමුණින්, රාජ්‍ය නොවන සංවිධානයක ආධාර ඇතිව රුපියල් මිලියන ගණනාවක වියදමින් පානීය ජල යෝජනා ක්‍රමයක් දියත් කරන ලද බවත්;

(ii) එලෙස දියත්කරන ලද උක්ත යෝජනා ක්‍රමය සම්පූර්ණ නොකර අතරමගදී අත්හැර දමා ඇති බවත්;

(iii) එකී ගම්මානයේ ජනතාව තම පානීය ජල අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා දැඩි දුෂ්කරතාවයකට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පානීය ජල යෝජනා ක්‍රමය සම්පූර්ණ කර වලෛයන්කට්ටු ගම්මානයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාදීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

698/'19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2017.09.30 දිනට සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ රාජ්‍ය සමාගම්වල අධ්‍යක්ෂ ධූරයක් හෝ කළමනාකරණ මණ්ඩල සාමාජික ධූරයක් දරන ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන පුද්ගලයන් කවුරුන්ද;

(ii) 2017.09.30 දිනට සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ රාජ්‍ය සමාගම්වල අධ්‍යක්ෂ ධූරයක් හෝ කළමනාකරණ මණ්ඩල සාමාජික ධූරයක් දරන ද්විත්ව පුරවැසියන් වන පුද්ගලයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

763/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහ බැංකු බැඳුම්කර වංචාව හා සම්බන්ධ පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගම සෙලාන් බැංකුවේ පවත්වාගෙන යනු ලබන බවට සඳහන් මෙන්ඩිස් සමාගමේ ගිණුම හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ අමාත්‍යවරයන් ප්‍රමුඛ යම් යම් පුද්ගලයන්ට මුදල් ප්‍රදානයන් ලබා දී ඇති බව නිරන්තරයෙන් මාධ්‍ය මඟින් ප්‍රචාරය වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගම, මෙන්ඩිස් සමාගම නමින් සෙලාන් බැංකුවේ පවත්වාගෙන යන ගිණුමට 2015.01.01 සිට 2018.01.01 දක්වා බැර කර ඇති මුදල කොපමණද;

(ii) එම මුදල් බැර කර ඇති අවස්ථා සංඛ්‍යාව සහ එම එක් එක් අවස්ථාවේදී බැර කර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2015.01.01 සිට 2018.01.01 දක්වා වූ කාලය තුළ මෙන්ඩිස් සමාගමේ ගිණුමෙන් මුදල් නිදහස් කර ඇති දිනය, එම එක් එක් දිනයේදී නිදහස් කර ඇති මුදල් ප්‍රමාණය සහ එම මුදල් ගෙවා ඇති පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

844/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වී ඇති මූල්‍ය සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් හා අධ්‍යක්ෂ මණ්ඩල කවරේද;

(iii) යහපාලන රජය බලයට පැමිණි දින සිට මූල්‍ය අර්බුදවලට ලක් වූ මූල්‍ය සමාගම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) එම එක් එක් මූල්‍ය සමාගමේ තැන්පතු පවත්වාගෙන ගොස් ඇති තැන්පතුකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු කිරීම සඳහා මෙතෙක් ගනු ලැබූ හා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

870/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එල්. පී.කරුණාරත්න යන අය ඇතුළු තවත් 17 දෙනෙකුට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ විශ්‍රාම වැටුප් ගෙවීමේදී අසාධාරණයක් සිදු වී ඇති බවත්;

(ii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ හා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශයන්ද එවකට තිබූ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නංවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් පැවැත්වූ විමර්ශනයේදී එවකට පැවති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් විශ්‍රාම වැටුප් ගෙවීමට පොරොන්දු වී ඇති බව පිළිගන්නේද;

(ii) ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා දී ඇති නිර්දේශද ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(iii) මෙම පුද්ගලයන්ට විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

902/'19

ගරු බිමල් රත්නායක මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නියං සහනාධාර ලබාදීම වෙනුවෙන් නිකුත් කරන ලද අංක NDRSC/2018/03 චක්‍රලේඛයේ 4 වගන්තිය අනුව පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෑම ග්‍රාම නිලධාරි වසමකම ක්ෂේත්‍ර නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් කමිටු පත් කර තිබේද;

(ii) එසේ නම්, රැස්වූ වාර ගණන, දින, වේලාවන්, ස්ථාන, පැමිණීම, න්‍යාය පත්‍රය සහ සාකච්ඡා සටහන් ඉදිරිපත් කරන්නේද;

(iii) කිසිදු ප්‍රතිලාභියෙක් නොමැති බවට කමිටුව ඒකමතිකව නිර්දේශකර තිබේද;

(iv) එම නිර්දේශය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මීට අදාළව ප්‍රාදේශීය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් අදාළ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුව රැස්වී තිබේද;

(ii) එසේ නම්, එම රැස්වීම් පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) කිසිදු ප්‍රතිලාභියෙක් නොමැති බවට කමිටුව ඒකමතිකව නිර්දේශ කර තිබේද;

(iv) එම නිර්දේශය ඉදිරිපත් කරන්නෙහිද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2018 නියං සහනාධාර අදියර II ක්‍රියාත්මක කිරීමේදී පොල්පිතිගම ජනතාවට අසාධාරණයක් සිදු වූ බව පිළිගන්නේද;

(ii) එය නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) අදාළ සහනාධාර ජනතාවට ලබා දෙන්නේද;

(iv) වැරදිකරුවන්ට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

980/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ - මඩකලපුව දුම්රිය මාර්ගයේ කලාවැව දුම්රිය ස්ථානය විශාල මගීන් පිරිසක් භාවිත කරන දුම්රිය ස්ථානයක් බවත්;

(ii) මගී ජනතාවට දුම්රිය ස්ථානයේ සිට ප්‍රධාන පාරට ප්‍රවිෂ්ට වීම සඳහා ඇති මීටර් 300ක් පමණ වූ මාර්ගය ඉතාමත් අබලන් තත්ත්වයට පත්වී ඇති බවත්;

(iii) මේ හේතුවෙන් දුම්රිය මගීන් එම මාර්ගය භාවිත නොකර අනතුරුදායක ලෙස දුම්රිය වේදිකාවේ සිට දුම්රිය මාර්ගය හරහා ගමන් කර ප්‍රධාන පාරට ප්‍රවිෂ්ට වීමේදී අනතුරුවලට ලක්විය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මීටර් 300 ක් පමණ වූ කෙටි මාර්ගය කඩිනමින් සංවර්ධනය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1135/'19

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෘජු හෝ වක්‍රව ලක්ෂ සංඛ්‍යාත පිරිසකගේ ජීවනෝපාය මාර්ගයක් වන එමෙන්ම, 100% දේශීය කර්මාන්තයක් වන සෙවිලි උළු කර්මාන්තය දියුණු කිරීමට රජය ගෙන ඇති පියවර කවරේද;

(ii) මෙම කර්මාන්තය සීඝ්‍ර කඩාවැටීමකට ලක්වී ඇති බව දන්නේද;

(iii) මෙම කර්මාන්තය බිඳ වැටීමෙන් දේශීය කර්මාන්තකරුවන් වන මැටි සෙවිලි උළු නිෂ්පාදකයන්ට හා එම ආයතනවල සේවයේ නියුතු සේවකයන්ට අත්වන ඉරණම කවරේද;

(iv) ඇස්බැස්ටෝස් තහඩු නිපදවන බහු ජාතික සමාගම්වලට තීරුබදු සහන ලබාදෙමින් රජයේ ආයතනවලට ඇස්බැස්ටෝස් තහඩු මිලදී ගනු ලබන බව දන්නේද;

(v) දේශීය මැටි සෙවිලි උළු නිෂ්පාදකයන්ට මේ වනවිට ලබා දී ඇති රාජ්‍ය අනුග්‍රහය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1138/'19

ගරු කනක හේරත් මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර කර්මාන්තයෙන් පසුගිය වර්ෂ 5ක කාලය තුළ ශ්‍රී ලංකාව ලැබූ ආදායම, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මත්ස්‍ය නිෂ්පාදන අපනයනය මඟින් පසුගිය වර්ෂ 5ක කාලය තුළ ශ්‍රී ලංකාව ලැබූ ආදායම, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ නිෂ්පාදන රටේ පරිභෝජනය සඳහා ප්‍රමාණවත් නොවන්නේද;

(ii) ශ්‍රී ලංකාවට මත්ස්‍ය නිෂ්පාදන ආනයනය කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා වර්ෂයකට වැය වන මුදල කොපමණද;

(iv) මත්ස්‍ය නිෂ්පාදන ආනයනය මඟින් මෙරට ධීවර කර්මාන්තය පසුබෑමකට ලක් නොවන්නේද;

(v) සාගරයෙන් වට වූ දූපතක් වන අප රටේ ධීවර කර්මාන්තය මහා පරිමාණයෙන් දියුණු කළ හැකිව තිබියදී එසේ නොකරන්නේ මන්ද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 දෙසැම්බර් 19 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

57/'18

ගරු හේෂා විතානගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ලියන්ගහවෙල, 7 කනුව, කඩ වීදිය නමින් ඉපැරණි ස්ථානයක් තිබෙන බවත්;

(ii) මෙම ස්ථානය පසුගිය වසර කිහිපය තුළ ප්‍රාදේශීය සභාව විසින් නිසි ලෙස නඩත්තු කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ප්‍රාදේශීය සභාව හරහා මෙම ස්ථානය සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

100/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රටේ පවත්නා අපරාධ මැඩලීමේ කටයුතුවල යෙදී සිටියදී 2015 වර්ෂයේ සිට ආබාධවලට ලක් වූ පොලිස් නිලධාරින් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) එම පොලිස් නිලධාරින් අතරින් පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් වෙනුවෙන් ගෙවා ඇති දීමනා ප්‍රමාණය කොපමණද;

(iv) දීමනා ගෙවා නොමැති නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ට දීමනා ලබා නොදීමට හේතු කවරේද;

(vi) පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වූ නිලධාරීන් සඳහා මාසික වේතන නිසි පරිදි ලබා දෙන්නේද;

(vii) මාසික වේතන ලබා නොදෙන පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වූ නිලධාරින් සිටින්නේද;

(viii) එසේ නම්, ඔවුන්ට මාසික වේතන ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

166/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 අප්‍රේල් 09 දිනැති අංක අපෙ/15/0180/6/3/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක් අමාත්‍යවරයකු සඳහා පත් කළ හැකි උපදේශකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ වුවද, ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සඳහා උපදේශකයන් 07 දෙනෙකු පත්කර තිබූ බව දන්නේද;

(iii) උපදේශකයන් පත්කිරීම සම්බන්ධයෙන් පැහැදිලි අමාත්‍ය මණ්ඩල තීරණයක් තිබියදී, එය නොසලකා ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සඳහා උපදේශකයන් 07 දෙනෙකු පත්කර ගනු ලැබුයේ කවර නීතිමය ප්‍රතිපාදනයක් මතද;

(iv) මේ සම්බන්ධයෙන් විගණන විමසුමේ දක්වා ඇති කරුණු අනුව නිවැරදි කිරීම් සිදු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

423/'19

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චිවේලි පුරාවිද්‍යා ස්ථානය ගැසට් කර ඇති දිනය කවරේද;

(ii) එම පුරාවිද්‍යා ස්ථානය පිළිබඳව පුරාවිද්‍යාත්මක සමීක්ෂණයක් හෝ ගවේෂණයක් සිදු කර තිබේද;

(iii) මෙතෙක් හමුවී ඇති පුරාවිද්‍යාත්මක කරුණු කවරේද;

(iv) ඒ පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) මෙම පුරාවිද්‍යා ස්ථානය විනාශයට තුඩුදෙන අයුරින් එයට අයත් ඉඩම්වල කිසියම් බාහිර පාර්ශවයන් පදිංචිව සිටින්නේද;

(vi) ඒ අනුව එම පුරාවිද්‍යා ස්ථානයට සිදුවී ඇති හානිය පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(vii) මේ වනවිට මෙම පුරාවිද්‍යාත්මක ස්ථානය ආරක්ෂා කිරීමට ගෙන ඇති නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

780/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1989.09.11 දින කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහකාර කළමනාකරු (ව්‍යාපෘති) ලෙස පත්වීම් ලබාගත් නිලධාරින්ගේ නම් කවරේද;

(ii) එම තනතුරේ වැඩ භාරගත් එක් නිලධාරියකු එම තනතුරට හිමි 1989 සැප්තැම්බර් මාසයට අදාළ වැටුපට අමතරව, වෙනත් රාජ්‍ය ආයතනයකින්ද එම මාසයටම වැටුප් ලබා ඇති බව දන්නේද;

(iii) එම නිලධාරියාට දේශපාලන අවශ්‍යතා මත ලබාදී තිබූ සහකාර සාමාන්‍යාධිකාරි (සේවා) තනතුර 2007.06.19 දින සිට අධිකරණ තීන්දුවකින් අවලංගු කර ඔහු පෙර සිටි තනතුරට එනම්, සහකාර ව්‍යාපෘති කළමණාකරු (vi ශ්‍රේණිය) පත් කළ බව දන්නේද;

(iv) ඒ අනුව, 2007.06.19 සිට 2015 අවසාන වනතෙක් තනතුරට හිමිකම් නොමැති වැටුප් සහ දීමනා ලෙස කොපමණ මුදලක් එම නිලධාරියා විසින් ලබාගෙන තිබේද;

(v) එම මුදල් ආපසු අයකර ගැනීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

817/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, අධ්‍යාපන කලාප 5 තුළ "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ වැඩිදියුණු කිරීමට තෝරා ගෙන ඇති පාසැල් කවරේද;

(ii) එම එක් එක් පාසලේ යෝජිත වැඩිදියුණු කිරීම් කවරේද;

(iii) එම එක් එක් පාසල වැඩිදියුණු කිරීමට අවම වශයෙන් ලබාදෙන මුදල කොපමණද;

(iv) එම පාසල්වල මේ වනවිට සිදුකර ඇති සංවර්ධන කාර්යයන් හා ඒවාට වැය කර ඇති මුදල කොපමණද;

(v) ත්‍රිකුණාමලය වැනි දුෂ්කර පළාත්වලට ගුරුවරුන් නොපැමිණීමට ගුරු නිවාස හිඟය දැඩි ලෙස බලපා ඇති බැවින්, එවැනි ගැටලු විසඳීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

827/'19

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, අරක්කොට්ටියා (පළිබෝධ) උවදුර හේතුවෙන් දැනට වී වගා අක්කර දහස්ගණනක් හානියට පත්වී ඇති බවත්;

(ii) අස්වනු නෙළන කාලය බැවින්, ඉහත උවදුර හේතුවෙන් ගොවි ජනතාව දැඩි පීඩාවට පත්වී සිටින බවත්;

(iii) අරක්කොට්ටියා උවදුර අනිකුත් ප්‍රදේශයන්ටද පැතිරෙමින් තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අරක්කොට්ටියා උවදුර පාලනය කිරීම සඳහා යම්කිසි ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) අරක්කොට්ටියා උවදුර හේතුවෙන් පීඩාවට පත්වී සිටින අම්පාර දිස්ත්‍රික් ගොවීන් සඳහා යම් වන්දි මුදලක් ලබාදීමේ හැකියාවක් තිබේද;

(iii) දැනටමත් සේනා දළඹු උවදුර හේතුවෙන් පීඩාවට පත්වී සිටින ගොවීන්ට වගා හානි සඳහා වන්දි මුදල් ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

846/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය වාර්ෂිකව ඉපැයූ ආදායම, වැයකරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලසීමාව තුළ බඳවාගත් සේවකයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් හා තනතුරු නාම කවරේද;

(iii) එකී කාලසීමාව තුළ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය තුළ නිදහස් මාධ්‍ය කලාවක් ඇති කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(iv) ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය තුළ චෝදනාවලට ලක්වූවන්ට එරෙහිව ගෙන ඇති පියවර සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

871/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දම්රෝ සමාගම ඇතුළු තවත් බොහෝ සමාගම්වල වතුයායවල රබර් ගස්වල කඳ මත ගෑස් මූණක් දැමීමෙන්ද, අලුත් ගස්වල රසායනික ද්‍රව්‍ය ආලේප කිරීමෙන්ද කිරි ලබාගන්නා බවත්;

(ii) මෙසේ කිරි ලබා ගත හැකි කාලය ඉක්මනින් අවසන් වූ පසු එම ගස් කපා ඒවායින් පල්ප සාදා වෙනත් කර්මාන්තවලට යොදා ගැනීම පාලකයන්ගේ සැලසුම බවත්;

(iii) මෙසේ රබර් ගස් ඉවත් කරන ලද ඉඩම්වල කටුපොල් වගා කිරීමට පාලකයන් සැලසුම්කර ඇති බවත්;

(iv) මෙය සේවකයන්ගේ රැකියාවලට තර්ජනයක් හා පරිසරයට සිදුකරන බලවත් විනාශයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා අප්‍රමාදව මැදිහත් වන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

948/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල ප්‍රධාන දුම්රිය ස්ථානයේ සිට මාතර දෙසට පිහිටි මුහුදුබඩ දුම්රිය මාර්ගය ඉන්දියානු රජයේ ආධාර ඇතිව නවීකරණය කළ බවත්;

(ii) එම නවීකරණයේදී ගාල්ල තලාපිටිය, බණ්ඩාරනායක පෙදෙස හා තක්කියා පටුමඟ අතර දුම්රිය මාර්ග රක්ෂිතයට යාබදව ඇති නිවාස හා ඉඩම්වලට යෑමට ඇති එකම ප්‍රවේශ මාර්ගය, දුම්රිය මාර්ගයට සම්පූර්ණයෙන්ම යටවීමෙන් පදික මාර්ගයක් බවට පත්වීම හේතුවෙන් එම පදිංචිකරුවන්ට ගමනාගමනය සඳහා සුදුසු ප්‍රවේශ මාර්ගයක් නොමැති තත්ත්වයක් උදාවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ මූලික අවශ්‍යතාවයක් වන ආරක්ෂිත ප්‍රවේශ මාර්ගයක් ඉදිකර දීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

981/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරුමැද පළාතේ ප්‍රධාන නගරය වන අනුරාධපුර නගරයට නොදෙවෙනි, විශාල ජනතාවක් දිනපතා රටේ විවිධ දිශාවලට යොමුවන කේන්ද්‍රස්ථානයක් බවට තඹුත්තේගම නගරය පත්වී ඇති බවත්;

(ii) විශාල පවුල් සංඛ්‍යාවක් මෙම නගරය ආශ්‍රිතව ජීවත්වන බවත්;

(iii) එම නගරය දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට නොදෙවෙනි වූ වෙළඳ ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටි නගරයක් බවත්;

(iv) තඹුත්තේගම නගරයේ පොදු බස් නැවතුම්පොළ මගී ජනතාවට පරිහරණය කළ නොහැකි අයුරින් අබලන් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දිනපතා විශාල බස් මගීන් සංඛ්‍යාවක් ගැවසෙන බස් නැවතුම්පොළේ මගී ජනතාවගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට සුදුසු වැසිකිළි, කැසිකිළි පද්ධතියක් නොතිබීම;

(ii) මගී ජනතාවට නිසි ආරක්ෂාවක් සහිත මගී ආවරණයක් නොමැති වීම;

(iii) වර්ෂා කාලයට බස් නැවතුම්පොළ භූමිය තුළ ජලය රැඳීමෙන් මගී ජනතාව අපහසුතාවයට පත්වීම;

වැනි කරුණු පිළිබඳව මෙතෙක් අවධානය යොමු නොවූයේ මන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අඩුපාඩු සපුරාලීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම බස්නැවතුම්පොළ මගී ජනතාවට මනා සේවාවක් ලබා ගත හැකි ආකාරයට සකස් කර දෙනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1031/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 245ට අනුව, කොළඹ නව නගර ශාලාව අසල ආසන 7000කින් යුත් සම්මේලන ශාලාවක් ඉදිකිරීම සඳහා වෙන්කළ රුපියල් මිලියන 3000ක මුදල උපයෝජනය කළ ආකාරය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) උක්ත ව්‍යාපෘතිය සඳහා හවුල්වන පෞද්ගලික අංශයෙහි ආයෝජකයන් කවුරුන්ද;

(iii) මෙම අයවැය යෝජනාවට ප්‍රතිචාර දැක්වූ දේශීය හා විදේශීය ආයෝජකයන්ගේ නම් ලැයිස්තුවක් සහ ඔවුන්ගේ ආයෝජන වටිනාකම දැක්වෙන වගුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1079/'19

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මියගිය හා තුවාල ලැබූ සියලුමදෙනාගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්නේද;

(ii) මේ වනවිට වින්දිතයන්ට ලබා දී ඇති වන්දි හා ප්‍රදානයන් වෙන් වෙන් වශයෙන් දක්වන්නේද;

(iii) මෙම ප්‍රහාරයෙන් ජීවිත අහිමි වූ පුද්ගලයන්ගේ යැපෙන්නන් සඳහා දිගුකාලීනව ලබාදීමට බලාපොරොත්තු වන සහන කවරේද;

(iv) ප්‍රහාරයෙන් තුවාල ලැබූ සහ දිගු කාලීන ප්‍රතිකාර අවශ්‍ය පුද්ගලයන් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබේද;

(v) එසේ හඳුනාගත් පුද්ගලයන්ට ලබාදෙන වෛද්‍ය සහ අනෙකුත් ආධාර කවරේද;

(vi) ප්‍රහාරය හේතුවෙන් පූර්ණ වශයෙන් ආබාධවලට ලක්වූවන්ට විශේෂ ආධාර වැඩපිළිවෙළක් හඳුන්වා දී තිබේද;

(vii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1136/'19

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටාන අධ්‍යාපන කොට්ඨාසයේ "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහනට ඇතුළත් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ කටාන අධ්‍යාපන කොට්ඨාසයේ තෝරාගත් පාසල් අතරින් මුල්ගල පමණක් තබා ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති පාසල් ඇති බව දන්නේද;

(iii) මුල්ගල පමණක් තබා ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොමැති පාසල්වල වැඩ අවසන් කරනු ලබන නිශ්චිත කාල වකවානු සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1139/'19

ගරු කනක හේරත් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට අයත් භූමි ප්‍රදේශය හා මුහුදු සීමාවන් තුළ ඛනිජ තෙල් හෝ ස්වභාවික වායු ඇති බවට මේ වනවිට තහවුරු කරගෙන තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රදේශ කවරේද;

(iii) එම ගවේෂණ කටයුතු සිදු කරනු ලබන සමාගම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම ගවේෂණ කටයුතුවල වර්තමාන තත්ත්වය කවරේද;

(ii) ඛනිජ තෙල් නිධි සම්බන්ධ ගවේෂණ කටයුතු සිදුකළ ඇතැම් විදේශ සමාගම්, එම ගවේෂණ කටයුතු අතරමඟ නවතා රටින් පිටව ගොස් තිබේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 දෙසැම්බර් 20 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

59/'18

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට අද දක්වා ධාවනයෙන් ඉවත් කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ ඉවත් කරන ලද මැදිරි අතරින් අලුත්වැඩියා කර නැවත ධාවනයට එක් කරන ලද මැදිරි සංඛ්‍යාව කොපමණද;

(iii) එම මැදිරි අලුත්වැඩියා කරන ලද ආයතනයේ නම කවරේද;

(iv) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) ධාවනයෙන් ඉවත් කරන ලද සෙසු දුම්රිය මැදිරි යළි ධාවනයට එක් කිරීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

101/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2017.12.31 දිනට උසාවිවල නොවිසඳී පවතින නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් අධිකරණ වර්ගීකරණය අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) වසර 5කට වැඩි කාලයක් නොවිසඳී පවතින නඩු සංඛ්‍යාව කොපමණද;

(iv) වසර 10කට වැඩි කාලයක් නොවිසඳී පවතින නඩු සංඛ්‍යාව කොපමණද;

(v) ඉතා පහසුවෙන් විසඳිය හැකි නමුත් දීර්ඝ කාලයක් තුළ නොවිසඳී ඇති නඩු කඩිනමින් විසඳීම සඳහා පියවර ගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

167/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.01.01 දින සිට 2017.05.31 දින දක්වා සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයෙහි පවත්වා ඇති ක්‍රිකට් තරඟ කවරේද;

(ii) එම තරඟවලින් උපයා ඇති මුදල කොපමණද;

(iii) ක්‍රිකට් ක්‍රීඩකයන්ට නවාතැන් ගැනීමට අවශ්‍ය තරු පංතියේ හෝටලයක් මෙම ක්‍රීඩාංගණය ආශ්‍රිතව ඉදිකිරීමට අමාත්‍යාංශය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

370/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2002 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ලූල්කඳුර වතුයායේ සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

425/'19

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, කදුරුගොඩ ඓතිහාසික පුරාවිද්‍යා ස්ථානය ගැසට් කර ඇති දිනය කවරේද;

(ii) එම පුරාවිද්‍යා ස්ථානය පිළිබඳව කරන ලද සමීක්ෂණ හා ගවේෂණ අනුව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) එහි චෛත්‍ය භූමිය ආක්‍රමණය කර අනවසර පදිංචිකරුවන් පදිංචි වී සිටින්නේද;

(iv) අනවසර පදිංචිවීම් හේතුවෙන් පුරාවිද්‍යා ස්ථානයට සිදු වී ඇති විනාශය පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) මෙම පුරාවිද්‍යා උරුමයන් රැක ගැනීමට ගෙන ඇති නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

501/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.02.01 දින සිට 2018.01.31 දින දක්වා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවට සැපයූ ආහාර වර්ග කවරේද;

(ii) එම ආහාර සැපයීම සිදු කළ සැපයුම්කරුවන්ගේ, උප සැපයුම්කරුවන්ගේ සහ ආයතනවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ආයතන අතරින් කූට ලේඛන ඉදිරිපත් කරමින් හා ප්‍රසම්පාදන නියෝගවලට බැහැරව කටයුතු කළ ආයතන කවරේද;

(iv) ප්‍රසම්පාදන කමිටු අනුමතියකින් තොරව භාණ්ඩ මිලදී ගැනීමට උපදෙස් ලබාදුන් නිලධාරීන් හා භාණ්ඩ ඇනවුම් කළ නිලධාරීන්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

(v) නීති විරෝධී මිලදී ගැනීම් හේතුවෙන් රජයට සිදු වූ අලාභය කොපමණද;

(vi) එම අලාභය අදාළ පුද්ගලයන්ගෙන් හා ආයතනවලින් අයකර ගැනීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

563/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය මාසවල වයඹ පළාතේ දැඩි නියඟයක් පැවති බව දන්නේද;

(ii) එසේ නම්, එම කාලසීමාව තුළ ගල්ගමුව මැතිවරණ කොට්ඨාසයේ පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නියං සහනාධාර ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ට ලබා දුන් සහන මල්ලේ තිබූ වියළි ආහාරවල මිල ගණන් වෙළෙඳපොළේ මිලට වඩා ඉහළ බවට චෝදනාවක් නැගී ඇති බව දන්නේද;

(v) එසේ නම්, මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

813/'19

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රැකියා විරහිත උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් රජයේ ආයතනවල අභ්‍යාසලාභී පුහුණුව සඳහා බඳවා ගැනීමට ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් දැන්වීමකට අනුව, ඒ සඳහා අයදුම්පත් යොමු කළ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටි උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සම්මුඛ පරීක්ෂණයෙන් පසුව පුහුණුව සඳහා බඳවා ගන්නා ලද උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ පුහුණුව සඳහා බඳවා ගැනීමේදී උපාධිධාරීන් බාහිර හා අභ්‍යන්තර උපාධිධාරීන් වශයෙන් වර්ගීකරණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, බඳවා ගත් බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව සහ අභ්‍යන්තර උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බාහිර උපාධිධාරීන් සඳහා පත්වීම් ලිපි ලබා දීමේදී ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වූයේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

828/’19

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමානයේ ආනයනය කරනු ලබන අර්තාපල් මත වූ බද්ද 20% කින් පහත දමා ඇති බවත්;

(ii) යාපනයේ අර්තාපල් කිලෝවක නිෂ්පාදන වියදම රු.55/- ක්ව පවතින අතර, ආනයනය කරන ලද අර්තාපල් කිලෝ එකක් වෙළෙඳපොළෙහි රු.50/- කට අලෙවි වන බවත්;

(iii) පෙබරවාරි 15 වැනි දින සිට යාපනය දිස්ත්‍රික්කයේ අර්තාපල් වගාවේ අස්වනු නෙළන කාලය ආරම්භ වන හෙයින්, ආනයන කරනු ලබන අර්තාපල් මත වූ බදු අඩු කිරීම හේතුවෙන් දේශීය අර්තාපල් වගාකරුවන් මහත් සේ පීඩාවට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දේශීය අර්තාපල් වගාකරුවන්ගේ යහපත උදෙසා, ආනයනය කරනු ලබන අර්තාපල් මත පනවා ඇති බදු අඩු කිරීම ඉවත්කර, එය දේශීය නිෂ්පාදන අලෙවිය අවසන් වන තෙක් වැඩි කිරීමට පියවර ගන්නේද;

(ii) මෙවැනි ක්‍රියාමාර්ග දේශීය නිෂ්පාදනයන්ගේ (අර්තාපල් - ලූණු) අස්වනු නෙළන කාලයට එක් මසකට පෙරාතුවම ක්‍රියාත්මක කරන්නේද;

(iii) මේ වෙනුවෙන් ස්ථිර යාන්ත්‍රණයක් පිහිටුවා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

872/’19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිරිඇල්ල, කඩුගම්මුල්ල, පහළ ගලතුර, ගංගරාවත්ත නමැති ඉඩමේ නිවාස 34ක පදිංචි පවුල් 39 අතරින් කොටසක් 1955 වර්ෂයේ සිටද, ඉතිරි කොටස් 1978 වර්ෂයේ පමණ සිටද වී ගොවිතැනේ නිරත වෙමින් දුකසේ ජීවත්වන බවත්;

(ii) මොවුන් අතරින් පවුල් 4කට රජයේ සන්තකය ආපසු පවරා ගැනීම යටතේ රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඉවත් කිරීමේ තීරණය ලබාදී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පවුල් ඉවත් කරනු ලැබුවහොත්, ඔවුන් දරුවන් සමඟ අවතැන් වන බව පිළිගන්නේද;

(ii) මෙම තත්ත්වය යටතේ මෙම අක්කර 64ක පමණ භූමිය ගම් පුළුල් කිරීම සඳහා අත්කරගෙන මෙම පවුල් අතර නියමිත ප්‍රමිතියකින් යුතුව බෙදා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

917/’19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල ගුවන්තොටුපොළ ඉදිකිරීම සඳහා වැය කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම මුදල් සපයා ගත් මූලාශ්‍ර කවරේද;

(iii) එම ගුවන්තොටුපොළ විවෘත කළ දින සිට මේ දක්වා ලැබූ ආදායම හා නඩත්තු කටයුතු වෙනුවෙන් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම ගුවන්තොටුපොළ විවෘත කළ දිනයේ සිට මෙතෙක් එහි පැමිණි ගුවන් යානා සංඛ්‍යාව සහ ගුවන් සේවා ආයතනවල නම් කවරේද;

(v) එම කාලසීමාව තුළ මත්තල ගුවන්තොටුපොළ හරහා ගමන්ගත් මගීන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) මත්තල ගුවන්තොටුපොළ දියුණු කිරීම සම්බන්ධයෙන් යහපාලන රජයේ දැක්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

935/’19

ගරු මුහම්මදු නසීර් මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව, අංගොඩ, ගොතටුව, කුමරින් මාවත, අංක 229/3 ඒ දරන ස්ථානයේ දැනට පදිංචි ෆාතිමා මුම්තාස් මහත්මියට අවුරුදු 21 සහ 18 වයසේ පසුවන ආබාධිත සහෝදරයන් දෙදෙනෙකු සිටින බවත්;

(ii) උපතින්ම මානසික ආබාධිත තත්ත්වයේ පසුවන, දෙමව්පියන් අහිමිව සිටින මොවුන් දෙදෙනා සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය මඟින් මාසිකව ලබාදෙන මූල්‍යාධාර/වෛද්‍යාධාර මෙතෙක් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති අසරණ පවුලක සාමාජිකයන් වන එකී ආබාධ සහිත මොවුන් දෙදෙනා සඳහා මාසික මූල්‍යාධාර සහ වෛද්‍යාධාර නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

982/’19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) “ළඟම පාසල - හොඳම පාසල” වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව අධ්‍යාපන කලාපයේ, අ/විජිතපුර මහා විද්‍යාලයේ සංවර්ධනය සඳහා මුදල් ලබා දීමේදී අඩුපාඩු රාශියක් සිදු වීමට හේතු කවරේද;

(ii) වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන අඩුපාඩුවකින් හෝ ප්‍රමාදයකින් තොරව එම විද්‍යාලයට ලබාදීමට යම් ක්‍රමවේදයක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1020/'19

ගරු බිමල් රත්නායක මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් රජය විසින් රු.500/-ක විභාග ගාස්තුවක් අයකරමින් පුරප්පාඩු 3771ක් පිරවීම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරින් (iii ශ්‍රේණිය) බඳවා ගැනීම සඳහා විභාගයක් පැවැත්වූ බවත්;

(ii) එම විභාගය සඳහා 75,000කට අධික අයදුම්කරුවන් පිරිසක් පෙනී සිටි බවත්;

(iii) ඉන් සමත් වූ 1904 දෙනෙකුට 2017 වර්ෂයේදී පත්වීම් ලබාදුන් බවත්;

(iv) ඉතිරි පිරිසට 2018 වර්ෂයේදී පත්වීම් ලබාදෙන බවට පොරොන්දු වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විභාගයෙන් සමත්වූවන් අතරින් ඉතිරි පුරප්පාඩු 1867 සඳහා බඳවා ගැනීම් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1026/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) එවකට සිටි මුදල් අමාත්‍යවරයාගේ 'දින 100 විප්ලවය' පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් පරිදි ගර්භනී මාතාවන් සඳහා රුපියල් 20,000/- ක දීමනාවක් ලබාදුන්නේද;

(ii) 2015 සහ 2016 වර්ෂවලදී ඉහත ප්‍රතිලාභය හිමි වූ ගර්භනී මාතාවන්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iii) 2015 සහ 2016 වර්ෂවලදී ගර්භනී මාතාවන්ට රුපියල් 20,000/- බැගින් ලබාදීම වෙනුවෙන් රජය විසින් දරන ලද මුළු වියදම කොපමණද;

(iv) ඉහත (i) හි සඳහන් ප්‍රකාශනයේ 7.29 හි දැක්වෙන පරිදි නිකුත් කළ උපදෙස් චක්‍රලේඛයෙහි පිටපතක් සභාගත කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?